# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 216/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திக<br>Date | 06/02/2024<br>පැය 1620 | | |

**මාධ්‍ය නිවේදනය**

**පිපිරීමකින් පුද්ගලයකු මියයාම - අවිස්සාවේල්ල පොලිස් වසම.**

2024.02.06 වන අද දින දහවල් කාලයේ අවිස්සාවේල්ල පොලිස් වසමේ මාදොල ප්‍රදේශයේ දී යකඩ බඩු එක් රැස් කරන ස්ථානයක සිදු වු හදිසි පිපිරීමකින් එහි සේවකයකු තුවාල ලබා අවිස්සාවේල්ල රෝහලට ඇතුලත් කිරීමේදී මිය ගොස් ඇති බවට අවිස්සාවේල්ල පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 49ක් වූ මස්කෙලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය අවිස්සාවේල්ල ප්‍රාදේශීය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මරණකරු තවත් පුද්ගලයකු සමඟ යකඩ බඩු ගොඩගසමින් සිටින අවස්ථාවේ මෙම පිපිරීම සිදු වී ඇති බවට අනාවරණය වී ඇත. පිපිරීම සම්බන්ධව පරීක්ෂා කිරීම සඳහා අවිස්සාවේල්ල අපරාධ ස්ථාන පරීක්ෂක නිලධාරීන් කැඳවා ඇති අතර රජයේ රස පරීක්ෂක නිලධාරීන් කැඳවීමට නියමිතය. අවිස්සාවේල්ල පොලිස් ස්ථානය විසින් වැඩිදුර විමර්ෂන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**